කැලණිය විශ්වවිද්‍යාලය-ශ්‍රී ලංකාව

විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය
(බාහිර) - 2007

භූගෝල විද්‍යාව- GEOG - E1025

මානුෂ භූගෝල විද්‍යාව

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි    කාලය :පැය 03 යි

---

01. "මානුෂ භූගෝල විද්‍යාව යනු පෘථිවිය මතුපිට පවත්නා මානව සමාජ පිළිබඳව කෙරෙන සංයෝජනාත්මක (Synthetic) අධ්‍යයනයකි" (Ratzel). මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න.

02. පරිසර නියතිවාදය, ශඛ්‍යවාදය සහ පරිසරාත්මක වාදය යන සංකල්ප කෙටියෙන් පහදා, මානව ප්‍රගමනයට එකී සංකල්ප ඉවහල්වන ආකාරය නිදසුන් සහිතව ගෙනහැර දක්වන්න.

03. ලෝක ජනසංඛ්‍යාවේ අවකාශීය ව්‍යාප්තිය සඳහා බලපා ඇති භූගෝලීය නොවන සාධක මොනවාදැයි විස්තර කරන්න.

04. ගෝලීයකරණය සමඟ මානව වාර්ගික විවිධත්වයේ සංකීර්ණතාව ඇතිවන අයුරු පහදන්න.

05. ඔබ විසින් තෝරාගත් එක් කෘෂිකාර්මික ක්‍රමයක ගතිලක්ෂණ විට්ල්සිගේ (Whittlsey) කෘෂිකාර්මික වර්ගීකරණයේ නිර්ණායක පදනම් කරගෙන විමසන්න.

06. "වත්මන් බලශක්ති අර්බුදය මීට දශක හතරක පමණ පටන් විද්‍යමාන වූවකි." විග්‍රහ කරන්න.

07. මතු දැක්වෙන ඒවායින් දෙකකට කෙටි සටහන් සපයන්න.

    I. අග්‍රේෂ නගර - (Primate cities)
    II. ඝාතීය ජනසංඛ්‍යා වර්ධනය - (Expotential population growth)
    III. ආහාර සුරක්ෂාව - (Food security)
    IV. ඓන්ද්‍රීය කෘෂිකර්මාන්තය - (Organic agriculture)

08. සංවර්ධනය වෙමින් පවත්නා රටවල් මුහුණදෙන ප්‍රධාන ගැටලුවක් වන්නේ ප්‍රමාණාත්මක මානුෂ සම්පත ගුණාත්මක මානුෂ සම්පතක් බවට පරිවර්තනය කිරීමයි. සාකච්ඡා කරන්න.

****************************